" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date |
|---|---|---|
| CSWP/ADM/18-38/FI/06 | | 2023.06.20 |

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ අංක 01/2023

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරීන් සඳහා විනය දඬුවම් පැනවීම.**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2018 ට සමගාමීව මෙම පාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. නොනිමි විනය කරුණු පවතින නිලධාරියකු අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළැඹී විට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත්ව විශ්‍රාම ගන්වනු ලබන අතර එම විනය ක්‍රියාමාර්ගය අවසානයේ අදාළ චෝදනාවලට වරදකරු වුවහොත් එම නිලධාරියා නිලධාරියා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ ඉදිරි කටයුතු කරනු ලැබේ.

03. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 23:9 වගන්තිය/බස්නාහිර පළාත් විනය කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 30(8) වගන්තිය අනුව කිසියම් දඬුවමක් ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකිය යුත්තේ අදාළ වරද කළ දිනයි. ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරියකු සම්බන්ධයෙන් ද දඬුවම් ලෙස විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් යම් අඩු කිරීමක් කලද එම දඬුවම ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකිය යුත්තේ ද වරද කළ දිනය වේ.

04. එබැවින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරීන්ට විශ්‍රාම ගන්වන දිනයට පූර්වාසන්න වසර 5ක සතුටුදායක සේවා කාලයක් ඇත්නම් එම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප හා විශ්‍රාම පාරිතෝෂිකය කෙරෙහි බලපාන විනය දඬුවම, නිලධාරියාගේ අනෙකුත් විශ්‍රාමික ප්‍රතිලාභ කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු බවට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

05. මේ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් එම කොමිෂන් සභාවට දැන්විය යුතුය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.